**ශීර්ෂය 123 ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 309 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| 310 | රජයේ කර්මාන්තශාලාව |
| 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,855,521,554 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.3,091,867,529 ක් එනම් සියයට 80.19 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 4,719,829 ත් රු. 540,491,284 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3 ත් සියයට 51 ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 123 | 3,042,140,000 | 2,501,648,716 | 540,491,284 | 17.77 |
| 309 | 282,309,000 | 255,016,629 | 27,292,371 | 9.67 |
| 310 | 374,107,830 | 182,957,289 | 191,150,541 | 51.10 |
| 311 | 156,964,724 | 152,244,895 | 4,719,829 | 3.01 |
| **එකතුව** | **3,855,521,554** | **3,091,867,529** | **763,654,025** | **19.81** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 03 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12301 | 7,500,000 | 5,528,569 | 4,000,000 | 5,148,395 | 70,000,000 | 23,877,959 |
| 30901 | 20,000,000 | 16,342,773 | 12,000,000 | 15,376,865 | 85,000,000 | 46,168,430 |
| 31001 | 28,000,000 | 18,431,869 | 18,000,000 | 19,829,422 | 122,000,000 | 86,058,391 |
| 31101 | 14,000,000 | 5,772,892 | 7,400,000 | 12,367,902 | 90,000,000 | 30,270,981 |

## 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ රජයේ කර්මාන්තශාලාව විසින් විෂය අංක 31002 සහ 31003 යනුවෙන් පිළිවෙලින් ගබඩා අත්තිකාරම් ගිණුම සහ කළවැඩ අත්තිකාරම් ගිණුම යන වාණිජ අත්තිකාරම් ගිණුම් දෙකක් පවත්වා තිබුණි.

### (අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

රජයේ කර්මාන්තශාලා වාණිජ අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 31002 | 200,000,000 | 193,180,922 | 120,000,000 | 219,514,531 | 10,000,000 | 4,353,447 | 92,000,000 | 64,512,379 |
| 31003 | 450,000,000 | 430,391,111 | 280,000,000 | 459,937,207 | 180,000,000 | 117,828,358 | 5,000,000 | 1,632,964 |

### (ආ) මූල්‍ය ප්‍රතිඵල

වානිජ අත්තිකාරම් ගිණුම් දෙකක මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල 2013 | | මූල්‍ය ප්‍රතිඵල 2012 | |
|---|---|---|---|---|---|
| | | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු රහිතව | ලාභය/(පාඩුව) කල්පිත ගාස්තු සහිතව |
| | | රු. | රු. | රු. | රු. |
| 31002 | ගබඩා අත්තිකාරම් ගිණුම | 36,472,459 | 36,472,459 | (9,928,957) | (9,928,957) |
| 31003 | කළවැඩ අත්තිකාරම් ගිණුම | 25,439,298 | 25,238,298 | 101,485,931 | 101,284,931 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයන්ගේ එකතුව රු. 13,433,583 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 7002/0000/00/0067/0013/000 | 3,314 |
| රජයේ කර්මාන්තශාලාව | 7002/0000/00/0043/0013/000 | 13,430,269 |
| **එකතුව** | | **13,433,583** |

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු තුනක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 735,076,277 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | **රු.** |
| ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | 6000/0000/00/0015/0079/000 | 865 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0163/000 | 91,219,127 |
| | 6000/0000/00/0015/0176/000 | 641,321,928 |
| රජයේ කර්මාන්තශාලාව | 6000/0000/00/0015/0164/000 | 1,721,369 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0165/000 | 812,988 |
| **එකතුව** | | **735,076,277** |

## 2 කොටස

## එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

-----------------------------------------------

## 1. ශීර්ෂය 123 - ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ත් සියයට 41 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

----------------------

වර්ෂ 2 ක් ඉක්මවූ රු.90,625 ක්වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------------

විෂය අංක 12301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.68,770 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට ආයතනය අපොහොසත්වී තිබුණි.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

------------------------------------

**අභ්‍යන්තර විගණනය**

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පැවතුණද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

----------------------

2013 වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර තිබුණ ද එමගින් වාහන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**1.6 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**-------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 24 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 107 | 99 | 08 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 44 | 41 | 03 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **182** | **167** | **17** | **02** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 17 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

## 2. ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 20 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) යන පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-----------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

**------------------------**

වර්ෂ 2 ක් ඉක්ම වූ රු.22,496,331 ක තැන්පතු 192 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

**----------------------**

අභ්‍යන්තර විගණන ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර නොතිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන 02 ක් , වසර 04 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතිනි.

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### (අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | % | |
| හෝමාගම පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ අපවිත්‍ර ජලය ඉවත් කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම | 5.130 | 2013.07.13 | 2013.09.30 | 90 | මුදල් නොලැබීම |
| අගමැති කාර්යාලයේ මෝටර් රථ ගාල වැඩිදියුණු කිරීම | 57.647 | 2013.04.28 | 2013.12.30 | 66 | කම්කරුවන්ගේ හිඟ කම |
| රිදියාගම සෆාරි පාක් එකේ නිල නිවාස 04 ක් ඉදිකිරීම | 43.250 | 2013.07.02 | 2013.12.30 | 70 | හේතු ඉදිරිපත් කර නැත |
| රජයේ කර්මාන්තශාලාවේ ත්‍රී රෝද රථ ගාල ඉදිකිරීම | 6.30 | 2013.09.26 | 2013.10.23 | 50 | ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රශ්න |
| රජයේ කර්මාන්තශාලාවේ මායිම් තාප්පය ඉදිකිරීම | 16.38 | 2013.10.28 | 2013.12.02 | 35 | හේතු ඉදිරිපත් කර නැත |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම්**

**------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් සමන්තුරේ වී පර්යේෂණ ආයතනයේ නිලධාරින්ගේ නිල නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය **රු. මිලියන** 7.675 **ඇස්තමේන්තුගත පිරිවැයක**ට 2012 ජූනි 27 දින **ආරම්භ කර** තිබුණි. **2013 දෙසැම්බර් 31 දින** වනවිට **රු. මිලියන** 2.43ක් **වියදම් කර** තිබුණු අතර කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය නිසා ව්‍යාපෘතිය නිම නොකර අතහැර දමා තිබුණි.

**2.7 පාඩු හා හානි**

**--------------**

2011 ජුලි 01 දින අනතුරකට ලක්වූ වාහනයකට සිදුවූ හානියේ වටිනාකම රු.344,221 ක් වූ අතර ඉන් රක්ෂණයෙන් නොගෙවන ලද රු.70,262 ක් වූ අලාභය විසර්ජන ගිණුමෙන් හෙළිදරව් කර නොතිබුණි. තවද මෙම අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 110 | 64 | 46 | - |
| (ii) | තෘතියික මට්ටම | 23 | 10 | 13 | - |
| (iii) | ද්විතියික මට්ටම | 233 | 177 | 56 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 120 | 58 | - |
| (v) | වෙනත් | - | 16 | - | 16 |
| | **එකතුව** | **544** | **387** | **173** | **16** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පුරප්පාඩු 173 න් 84 ක්ම ඉංජිනේරු , ගෘහ නිර්මාණ ශිල්පි , තාක්ෂණ නිලධාරි සහ සැලසුම් ශිල්පී යන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයට සෘජුවම සම්බන්ධවන නිලධාරින්ගෙන් සමන්විත වන අතර මෙම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේ දී ද දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3. ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලාව

### 3.1 විගණන විෂය පථය

රජයේ කර්මාන්තශාලාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජනවාරි 27 දින කර්මාන්තශාලීය ඉංජිනේරු වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, වානිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, වානිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඌ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**-------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් රජයේ නිවාස සම්බන්ධයෙන් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(i) රජයේ නිවාස ලබා දී තිබූ නිලධාරීන්ගේ විස්තර ඇතුළත් යාවත්කාලීන කළ ලේඛනය

(ii) කර්මාන්තශාලාව සතු වර්ගීකරණය කරන ලද රජයේ නිවාස පිළිබඳ ලේඛනය.

(iii) එක් එක් නිවාසය සඳහා යාවත්කාලීන කරන ලද ගොනු.

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**-------------------------**

ණය ලිපිගොනු හෝ වෙනත් කිසිදු සාක්ෂියක් දෙපාර්තමේන්තුවෙහි නොතිබීම හේතුවෙන් නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවීමට ඇති එකතුව රු.74,929 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීම සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ඇ) සීමා පිළිනොපැදීම**

**------------------**

විෂය අංක 31003 දරන කළ වැඩ අත්තිකාරම් ගිණුම් කටයුත්තකට අදාලව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු උපරිම හර ශේෂ සීමාව රු.180,000,000 ක් වුවද තථ්‍ය හර ශේෂය රු.362,360,453 ක් වීම හේතුවෙන් හර ශේෂ සීමාව ඉක්මවීම රු.182,360,453 ක් හෙවත් සියයට 101 ක් විය.

**(ඈ) අයවැය විචලනය**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.1,025,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ත් සියයට 63 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) අග්‍රිම ගිණුම්**

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු 2013 දෙසැම්බර් 31 දිනට වූ අග්‍රිම ශේෂ එකතුව රු.446,037 ක් විය.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට අංක 43/13 දරන අග්‍රිම ගිණුමේ නොපියවූ හර ශේෂය රු.13,430,269 ක් ලෙස දක්වා තිබුණ ද ඉන් රු.1,083,784 ක් එම වර්ෂය තුළදී පියවා තිබීම හේතුවෙන් අග්‍රිම ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.

**(ඊ) පොදු තැන්පත් ගිණුම**

-----------------------

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.253,244 ක් වූ තැන්පතු 28 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 31001 දරන අත්තිකාරම් ගිණුම්පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.907,372 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට නිලධාරින් හය දෙනෙකුගේ උත්සව අත්තිකාරම් එකතුව රු.20,000 ක් ද නිලධාරින් හත් දෙනෙකුගේ විශේෂ අත්තිකාරම් එකතුව රු.7,250 ක් ද හෙළිදරව් කර නොතිබුණි. මේ අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.27,250 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**(ඉ) වාණිජ අත්තිකාරම් ගිණුම්**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 31002 දරන ගබඩා අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.62,880,677 ක් ලෙස දක්වා තිබුණ ද රු.3,017,046 ක් අඩුවෙන් සටහන් කිරීම හා රු.1,358,665 ක් වැඩියෙන් සටහන් කිරීම ගැලපූ පසු එදිනට නිවැරදි ණයහිමි ශේෂය රු.64,539,058 ක් විය. ඒ අනුව ණයහිමි ශේෂය රු.1,658,381 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) විෂය අංක 31003 දරන කළවැඩ අත්තිකාරම් ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගේ ශේෂය රු.362,360,452 ක් ලෙස දක්වා තිබුණ ද එම ශේෂය හා එකඟවන පරිදි කේවල ණයගැති ලෙජරයක් පැවැත්වීමට සහ එම කේවල ණයගැති ගිණුම් මාසිකව හෝ වාර්ෂිකව තුලනය කර පාලන ගිණුමේ ශේෂ සමග සසඳා නොතිබුණි. තවද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය තහවුරු කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) විෂය අංක 31003 දරන කළවැඩ අත්තිකාරම් ගිණුමට අදාළ 1995 වසරේ සිට 2007 වසර දක්වා ණයගැති ශේෂ 224 කට අදාළ රු.53,161,909 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**---------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

-------------------------

මුදල් රෙගුලාසි 133 හා 2009 ජනවාරි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. එසේම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ රජයේ කර්මාන්තශාලාවේ විගණනයක් සිදු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | --------------- | ------------- | ----------- | -------------------------- |
| | | | රු. | |
| (i) | කොළොන්නාවේ රජයේ කර්මාන්තශාලාවේ ඉඩම | අක්කර 15 | සොයාගත නොහැක | මෙම ඉඩමෙන් අක්කර 02 ක් පමණ වූ කොටසක් වර්ෂ 25 කට අධික කාලයක සිට අනවසර පදිංචිකරුවන් බුක්තිවිඳින බව තහවුරු විය. |
| (ii) | යන්ත්‍ර සූත්‍ර | | | |
| | පවුඩර් කෝටින් යන්ත්‍රාගාර | 01 | සොයාගත නොහැක | වර්ෂ 03 කට අධික කාලයක් |
| | යුනිවර්සල් ටූල් ෂාප්නර් | 01 | 1,440,000 | වර්ෂ 01 කට අධික කාලයක් |
| | පවර් ප්‍රෙස් මැෂින් | 01 | 1,109,304 | වර්ෂ 01 කට අධික කාලයක් |
| | Hollow Chisel Moriser & Borer | 01 | 2,728,250 | වර්ෂ 01 කට අධික කාලයක් |

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.53,800,863 ක් වූ අතර මෙයින් එකතුව රු.15,554,066 ක බැරකම් හෙළිදරව් කර නොතිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ------------------------------------ | ---------- | ----------------- |
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>--------------------------------- | | |
| XIX පරිච්ඡේදය 5 වගන්තිය | 69,501 | නිලධාරීන් 34 දෙනෙකුගෙන් රු.69,501 ක මුදලක් නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි. |

**(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**------------------------------------**

| | | |
|---|---|---|
| 3.3 මාරගෝපදේශය | 12,809,816 | මෙම වගන්තියට පටහැනිව සීමිත මිල කැඳවුම් ක්‍රමය යොදා ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී යන්ත්‍රෝපකරණ හා වාහන මිලදී ගෙන තිබුණි. |

## 3.7 කාර්ය සාධනය

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති 09 ක ඉලක්කගත ආදායම රුපියල් මිලියන 262.87 ක් වුවද ප්‍රගති සමාලෝචන වාර්තාවලට අනුව වාර්ෂික ප්‍රගතිය රුපියල් මිලියන 135.48 ක් විය. මේ අනුව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය අපේක්ෂිත තත්ත්වයට වඩා සියයට 0.9 සිට 82 දක්වා පරාසයක පහළ මට්ටමක පැවතුණි.

(ආ) 2013 වාර්ෂික ඇස්තමේන්තුවෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති රු.මිලියන 308.56 ක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

**-------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශයට අනුව මිල කැඳවීමේ දී දන්නා සියලු සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව කුඩාවේ නම් ඔවුන්ද ඇතුළුව තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගන්නා විභව සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවිය යුතු නමුත් 2013 නොවැම්බර් 30 දින මිලදී ගත් Boom truck 01 සඳහා ආයතන 06 කට මිල කැඳවුම් ලබා දී තිබුණ ද ඉන් ආයතන 02 කින් පමණක් මිල කියුම් ඉදිරිපත් කර තිබුණි. පසුව එම ආයතන 02 න් ලද මිල ගණන් සලකා බලා මෙම Boom truck රථය රු.11,540,505 කට මිලදී ගෙන තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**-----------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 15 | 06 |
| (ii) තෘතියික මට්ටම | 07 | 05 | 02 |
| (iii) ද්විතියික මට්ටම | 125 | 100 | 25 |
| (iv) ප්‍රාථමික මට්ටම | 466 | 370 | 96 |
| **එකතුව** | **619** | **490** | **129** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 20 ක් වූ පුරප්පාඩු 129 ක් පිරවීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6 ක්ද ද්විතීක මට්ටමේ පුරප්පාඩු 25 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 96 ක් ද විය.

## 4. ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

---

### 4.1 විගණන විෂය පථය

---

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ (ආ) යන පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**---------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 31101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,856,257 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ii) ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර 1997 වසරේදී ගෙවූ රු.175,000 ක් වූ ණය මුදලින් රු.121,305 ක් 2014 සැප්තැම්බර් 25 දින වන විට අයකර ගත නොහැකි වී තිබුණි.

**4.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**--------------------------------------**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**--------------------------------------------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා වගකිව යුත්තන් නිශ්වය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත්, අළුත්වැඩියා වියදම රු.1,029,029 ක් වූ වාහන අනතුරකට අදාලව එසේ කටයුතු කර නොතිබුණි.

**4.6 කාර්යසාධනය**

**----------------**

ජාතික භෞතික සැලැස්ම තුළින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් හඳුනාගැනීම හා මූලික ශක්‍යතා අධ්‍යයන කටයුතුවල ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ප්‍රගතිය සියයට 30 ක් විය.

**4.7 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**--------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 10 | 30 |
| (ii) | තෘතියික මට්ටම | 13 | 2 | 11 |
| (iii) | ද්විතියික මට්ටම | 135 | 83 | 52 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 47 | 32 | 15 |
| | **එකතුව** | **235** | **127** | **108** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 108 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියික සහ ප්‍රාථමික මට්ටම්වල පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව පිළිවෙලින් සියයට 75ක්, සියයට 85ක්, සියයට 39 සහ සියයට 32ක් විය. සෑම සේවා මට්ටමකටම එතරම් විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට අභියෝගයක් වී නොමැති බවට විගණනයේදී බැහැර කළ නොහැකි විය.